යටවත්ත ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 21 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට යටවත්ත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේදී රු.700,000ක් වැයකර ඉදිකර තිබූ ඩන්ගන් කොම්පෝස්ට් අංගනයේ වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) ඉඩම් කට්ටි කිරීමෙන් සභාවට පවරා දී තිබූ රු.132,500 ක් වටිනාකමින් යුතු ඉඩම් කොටස් දෙකක් දෙවරක් ප්‍රාග්ධනිත කර තිබූ අතර සභාවට අයත් තවත් ඉඩම් දෙකක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ මිලදීගෙන තිබූ රු.387,731 ක් වටිනාකමින් යුතු ද්‍රව්‍ය පොදු ගබඩා ශේෂයෙහි දක්වා නොතිබුණි.

(ඈ) ග්‍රීන් පාර්ක් ජල යෝජනා ක්‍රමයේ ජල මූලාශ්‍රය සකස් කිරීමේ ව්‍යාපෘතිය අඩක් නිමකර අතරමඟ නවතා දැමීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවෙත ගෙවා තිබූ අත්තිකාරමෙන් තවදුරටත් අයකර ගතයුතු රු.234,929 ක අත්තිකාරම් මුදල ණයගැතියන් යටතේ ගිණුම්ගතකර නොතිබූ අතර, අදාළ කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට නොමැති බැරකමක් වූ රු.112,071ක මුදලක් ණයහිමියන් යටතේ ගිණුම්ගතකර තිබුණි.

(ඉ) රු.1,250,000 ක පොදු අරමුදල් ව්‍යාපෘති 4 ක් සඳහා ඇස්තමේන්තු හෝ ගිවිසුම් සකස්කර නොතිබියදී ණයහිමි ලෙස දක්වා තිබුණි.

(ඊ) පළාත් නැගුම වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ වල්පොල සුසාන භූමියේ පැති බැම්ම ඉදිකිරීමේ කර්මාන්තයේ වටිනාකම රු.107,115 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 159,489 ක් වූ ගිණුම් විෂයයන් 2 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර රු.20,420ක වෙනසක් පැවතුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 7 ක වටිනාකම රු.17,708,333ක් වූ අතර, ඊට වර්ෂ 3කට වැඩි නිරවුල් නොකළ රු.54,250 ක ශේෂ ඇතුළත්ව තිබුණි.

1.3.4 ගෙවිය යුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ණයහිමි ගිණුම් ශේෂ 8 ක වටිනාකම රු.12,045,532 ක්වූ අතර, වර්ෂ 3 කට වැඩි නිරවුල් නොකළ එකතුව රු.880,099 ක් වූ ශේෂ ඊට ඇතුළත්ව තිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.

---------------------------------------------------

ගිණුම් විෂයයන් 11කට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.159,198,433ක්වූ ශේෂ සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

-----------------------------------------------------

නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988, ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව | |
| (i) 69 රීතිය. | ඉඩම් විකිණීම මත වන බදු පිළිබඳ ලේඛනයක් පී.එස්.26 සී ආකෘතිය ප්‍රකාරව පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ii) 218 රීතිය | 1987න් පසු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 571 සහ 572 | රු.236,001 ක වටිනාකමින් යුතු කර්මාන්ත 17 කට අදාල කල් ඉකුත් වූ අතරැදි මුදල් නිරවුල් කිරීමට හෝ ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මු.රෙ. 762 | 2008 - 2013 දක්වා වූ කාලපරිච්ඡේදය තුළ මිලදී ගෙන තිබුණු රු.142,708 ක ද්‍රව්‍ය/භාණ්ඩ ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවා තිබුණි. |

(ඇ) චක්‍රලේඛ හා වෙනත් ලිපි

| | |
|---|---|
| (i) 2015 ජූලි 14 දිනැති අංක 04 /2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සභාවේ වාහන 18 ක් සඳහා මිල ගණන් කැඳවීමකින් තොරව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රක්ෂණ ආවරණ ලබාගෙන ඒ සඳහා රු.498,905 ක් ගෙවීම් කර තිබුණි. |
| (ii) 2015 මාර්තු 10 දිනැති අංක 03/2014 (i) දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛයේ කාණ්ඩ අංක vi සහ මධ්‍යම පළාත් පළාත් පාලන කොමසාරිස්ගේ අංක 3/2/1/23 හා 2015 අගෝස්තු 26 දිනැති ලිපිය | පෞද්ගලික දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණය නොකර රු.2,000 ක දුරකථන දීමනාව වෙනුවට සහා ලේකම්ගේ වැටුපට රු.4,000 ක් එකතුකර ගෙවීම්කර තිබීම හේතුවෙන් වර්ෂය තුලදී රු.20,000 ක දුරකථන දීමනාවක් වැඩිපුර ගෙවා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,310,121 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,279,479 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,030,642ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,030,642ක වර්ධනයට ආදායම් විෂයයන් 4ක රු.10,569,265ක ආදායම වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 වෙනත් ආදායම්

(අ) අක්කර බදු

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු. 36,716 ක හිඟ අක්කර බදු ශේෂයක් විය.

(ආ) ජල ගාස්තු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ජල ගාස්තු ශේෂය රු. 92,856 ක් විය.

(ඇ) කසළ ගාස්තු

------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කසල ගාස්තු ශේෂය රු.14,850ක් විය.

(ඈ) ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු

----------------------------------

ප්‍රචාරණ දැන්වීම් පුවරු ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් සකස් කර අනුමතකරගෙන නොතිබුණු අතර, සභාබල ප්‍රදේශයේ ප්‍රදර්ශනය වන ප්‍රචාරණ දැන්වීම් පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීම සහ ප්‍රචාරණ දැන්වීම් ගාස්තු ලේඛනයක් පවත්වා ගැනීම සිදුකර නොතිබුණි.

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 273,500 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු.5,628,750 ක් අයවිය යුතුව තිබුණි.

2.4 අධිභාර

---------

ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද අධිභාර වලට අදාළව රු. 32,259 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

-------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු යටිතල පහසුකම් ඇති කිරීම මඟින් දියුණු ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර වරිපනම් බදු අයකර ගැනීම සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය අනුව, වල්පොල සුසාන භූමියේ ඉදිකිරීමට යෝජිත ආදාහනාගාරය අදියර දෙකකින් අවසන් කිරීම ප්‍රධාන අරමුණක් වී තිබුණද, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) ප්‍රාදේශීය සභාව මඟින් පාලනය වන ප්‍රජාශාලා 20 හි ඉඩම් සම්බන්ධ හිමිකම් ඔප්පු හා මිනින්දෝරු සැලසුම් නොතිබූ අතර, සුසාන භූමි 26 ක හිමිකම් ඔප්පු හා සුසාන භූමි 16 ක මිනින්දෝරු සැලසුම්ද විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ගලගම මෙගොඩවත්ත නැමැති ඉඩමේ අක්කර 1 රූඩ් 01 පර්චස් 7 ක ප්‍රමාණයෙන් නොබෙදූ තුනෙන් එකක පංගුවක් (පර්චස් 69) සභාවට හිමි වී තිබූ නමුත්, ඉඩමේ ඔප්පුවක්ද සභාව සතුව නොතිබූ අතර, ඉඩම සභාවට පැවරී වසර 23 ක කාලයක් ගතවී තිබුණද, සභාවට අයත්

ඉඩම් කොටසේ මායිම් තහවුරු කරගනිමින් සුදුසු පොදු කටයුත්තකට යොදා ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ රු.35,467,842 ක් වැයකර ඉදිකර තිබූ සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අවශ්‍ය වන ජලය ප්‍රාදේශීය සභා ජල පද්ධතියෙන් සෘජුවම ලබාගෙන තිබූ නමුත්, මෙම ඉදිකිරීමට අදාළව පරිභෝජනය කළ ජල පරිමාව හඳුනාගෙන කොන්ත්‍රාත්කරුගෙන් අයකිරීමට කටයුතුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 110 කින් 43 ක් සඳහා අනුමැතිය ලබාදී තිබූ නමුත්, අනුකූලතා සහතික නිකුත්කර තිබුණේ අයදුම්පත් 19 ක් සඳහා පමණි.

3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු
----------------------------------
කර්මාන්ත 4 ක් සඳහා මිලදීගෙන තිබූ රු.170,050 ක් වටිනා සිමෙන්ති මිටි 190 ක් 2017 පෙබරවාරි 08 දින වන විටත්, අදාළ කර්මාන්ත ආරම්භ නොකිරීම හේතුවෙන් සැපයුම්කාර ආයතනයේම රඳවා තිබුණි.

3.5 හඳුනාගත් අලාභ
--------------------
සභාව විසින් 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව විදුලි කාර්මික නිලධාරි තනතුර සඳහා ස්ථිර පත්වීමක් ප්‍රදානය කර 2015 දෙසැම්බර් 04 දිනැතිව එකී ස්ථිර පත්වීම අවලංගු කර නැවත දෛනික දීමනා ගෙවීමේ පදනම මත සේවයේ යෙදවීම හේතුවෙන් උක්ත නිලධාරියා විසින් 2016 සැප්තැම්බර් 25 දිනැතිව සභාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකර තිබූ නඩුවට අදාළව සභාවෙන් දරා තිබූ රු.300,000 ක නඩු ගාස්තුව, නිසි උපදෙස් ලබා ගැනීමකින් තොරව හා චක්‍රලේඛවලට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් සභාවට දැරීමට සිදු වූ නිෂ්ඵල වියදමක් වී තිබුණි.

3.6 කොන්ත්‍රාත් පරිපාලනය
-----------------------------
පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) දොරකුඹුර කනත්ත මාර්ගයේ පාලම ඉදිකිරීම.
---------------------------------------------------
ගමින් ගමට, දොරින් දොරට ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ වැඩසටහන 2014 යටතේ උක්ත කර්මාන්තය 2017 පෙබරවාරි 09 දින වන විටද, සම්පූර්ණ නොකර ඉදිකිරීම් කටයුතු නවතා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් වැඩ අවසන් කළ දිනය සඳහන් නොවූ දින රහිත රු.150,507 ක අවසන් බිල්පතක් ඉදිරිපත්කර තිබූ අතර, ව්‍යාපෘතිය ආරම්භකර වර්ෂ දෙකකට ආසන්න කාලයක් ගතවී තිබියදීත් අදාළ අරමුණ ඉටු වී නොතිබුණු බැවින්, ලබාදී තිබූ රු.98,000 ක අත්තිකාරම් මුදල නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ආ) ඩන්කන් පෙර පාසල හා ළමා උද්‍යානය සංවර්ධනය හා ඉදිකිරීම

-----------------------------------------------------------------------

ඩන්කන් පෙර පාසල හා ළමා උද්‍යානය සංවර්ධනය හා ඉදිකිරීම සඳහා 2012 සිට 2016 වර්ෂය දක්වා රු.2,184,523ක වියදමක් දරා තිබූ නමුත් එකී ගොඩනැගිල්ල හා ළමා උද්‍යානය පරිහරණය සඳහා වූ සුදුසු වැඩ පිළිවෙලක් සභාව සතුව නොතිබූ අතර 2017 පෙබරවාරි 15 වන විටත් පෙර පාසැල් ගොඩනැගිල්ල හා උද්‍යානය පිහිටි භූමියේ නිරවුල් අයිතිය ද සභාව සතුව නොතිබුණි.

(ඇ) වාලවෙල සායන මධ්‍යස්ථානය හා පෙර පාසල සඳහා වැසිකිළි පද්ධතියක් සකස් කිරීම

-------------------------------------------------------------------------------------------

පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන යටතේ උක්ත ව්‍යාපෘතිය ඉටුකිරීම සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ රු.668,360කට ගිවිසුම්ගතවී තිබුණි. මුදල් ප්‍රතිපූර්ණය සඳහා පළාත් පාලන කොමසාරිස් වෙත රු.628,810 ක බිල්පත් හා මිනුම්පත්‍ර ඉදිරිපත් කර තිබූ අතර, එකී බිල්පත්වල ඉටුකර නොතිබුණු වටිනාකම රු. 27,062 ක් වූ වැඩ විෂයයන් 5ක් ඉටුකළ බවට සාවද්‍ය ලෙස දක්වා තිබුණි.

(ඈ) ග්‍රීන් පාර්ක් ජල යෝජනා ක්‍රමයට ජල මූලාශ්‍රයන් ඉදිකිරීම.

-----------------------------------------------------------------

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම වැඩසටහන මඟින් ක්‍රියාත්මකකර තිබූ උක්ත ව්‍යාපෘතියේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ළිඳ ඉදිකිරීමේ භූමිය පිළිබඳව නිවැරදි ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබීම හේතුවෙන් යෝජිත ඉදිකිරීම් භූමිය සම්බන්ධව ඇතිවූ ගැටළු සහගත තත්ත්වය මත රු.112,071 ක වැඩ නිමකර ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා තිබුණු අතර, එම කොන්ත්‍රාත්කරුට ගෙවන ලද රු.347,000ක අත්තිකාරම් මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) උක්ත ව්‍යාපෘතිය අසාර්ථක වීම නිසා රු.1,677,354ක නව ඇස්තමේන්තුවක් මඟින් සෘජුශ්‍රම පදනමට ගැඹුරු නල ළිඳක් සාදා ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස්කර තිබූ නමුත්, මෙම නව ඇස්තමේන්තුව සඳහා අනුමැතියක් ලබාගෙන නොතිබුණු අතර, සභාවට නිරවුල් අයිතියක් නොමැති බාහිර පාර්ශ්වයකට අයත් භූමියක ළිඳ හා පොම්පාගාරය ඉදිකිරීම ආරම්භ කර තිබුණි.

(iii) දෙවන ව්‍යාපෘතිය සඳහා 2016 දෙසැම්බර් 30 දින රු.231,150 ක් වටිනා ජල පොම්පය මිලදීගෙන ගබඩා කර, රු.356,266 ක් වටිනා ජලනල හා උපාංග මිලදීගෙන කාර්මික නිලධාරි වෙත නිකුත්කර තිබූ නමුත් 2017 පෙබරවාරි 15 දින වන විටත් ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

3.7 ව්‍යාපෘති ප්‍රමාද කිරීම

------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා අරමුදලින් ප්‍රතිපාදනය වූ රු.2,800,000 ක ව්‍යාපෘති 11ක් 2017 පෙබරවාරි 15 දින වන විටද, ආරම්භ කර නොතිබුණු අතර, ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන - 2016 යටතේ ප්‍රතිපාදිත මුදල රු.1,200,000 ක් වූ ව්‍යාපෘති 8 ක්ද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ අනුමත කර හා ව්‍යාපෘතිවල සියළු කටයුතු 2016 ජූලි 30 දිනට පෙර නිමකළ යුතුව තිබූ ප්‍රතිපාදිත මුදල රු.450,000 ක් වූ ව්‍යාපෘති 3 ක වැඩ 2017 පෙබරවාරි 15 දින වන විටත් අවසන්කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ සිදුකළ පතිංගස්කොටුව ජල යෝජනා ක්‍රමය ජල මූලාශ්‍ර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ වැඩ විෂයයන් 29ට අදාල රු.542,192 ක් වටිනා ද්‍රව්‍ය හා උපාංග 2016 දෙසැම්බර් 09 දිනැතිව මිලදීගෙන සභා ගබඩාවේ ගබඩාකර තිබුණි. ජල ව්‍යාපෘයේ ඉදිකිරීමේ කටයුතු 2016 නොවැම්බර් 30 නිමකළ යුතු වුවද 2017 පෙබරවාරි 07 දින වන විටත් වැඩ නිමකර නොතිබුණි.

3.8 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

----------------------------------

2012 වර්ෂය වන විට පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා සභා අරමුදල් මඟින් රු.659,062ක් වැය කර ඉදිකර තිබූ ගොඩනැගිල්ල සහ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලැබී තිබූ රු.700,000 ක ප්‍රතිපාදිත මුදලින් නිමකර තිබූ ඩන්කන්වත්ත කොම්පෝස්ට් අංගනය අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි ඵලදායි කටයුත්තක් සඳහා යොදා ගැනීමට සභාව සතුව වැඩ පිළිවෙලක් නොවුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

4.1 අභ්‍යන්තර විගණනය

-------------------------

1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති 5(7) ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට පියවර ගෙන නොතිබුණි.

4.3 අයවැය පාලනය

--------------------

(අ) වැය විෂයයන් 41 ක් සඳහා සලසා තිබූ රු.12,872,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් දරා නොතිබූ අතර වැය විෂයයන් 11 ක් සඳහා සලසා තිබූ රු.755,000 ක මුල් ප්‍රතිපාදනයෙන් රු.546,200 ක් වෙනත් වැය විෂයයන්ට මාරු කිරීමෙන් පසුවත් ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 30 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදන සහ වියදම අතර, සියයට 40 සිට සියයට 98 දක්වා පරාසයක විචලනයන් පැවතුණි.

(ඇ) ආදායම් විෂයයන් 9 කට අදාළව රු.16,203,800 ක් වූ ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් අයකරගෙන නොතිබූ අතර ආදායම් විෂයයන් 11 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අඩුවීම අතර, විචලනය සියයට 37 සිට සියයට 98 අතර පරාසයක පැවතුණි. තවද ආදායම් විෂයයන් 18 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම වැඩිවීම අතර, විචලනය සියයට 33 සිට සියයට 450 ක අතර පරාසයක පැවතුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ අයවැය ලේඛනය සංශෝධනයට භාජනය කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනය

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ණයගැති හා ණයහිමි පාලනය.
(ආ) කාර්ය මණ්ඩල කළමනාකරණය.
(ඇ) වත්කම් කළමනාකරණය.
(ඈ) අයවැය පාලනය.
(ඉ) ගබඩා පාලනය.